

# ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනයේ (FCCISL) නව සභාපතිවරයා ලෙස කීර්ති ගුණවර්ධන මහතා වැඩ භාරගනී.

ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනයේ 47 වැනි වාර්ෂික මහ සභා රැස්වීමේදී කීර්ති ගුණවර්ධන මහතා පළමු වැනි කාන්තා සභාපතිනිය වන ෂර්ලි ජයවර්ධනගෙන් පාලනය භාරගනිමින් සභාපති ලෙස තේරිපත් විය.

ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය 1973 දී පිහිටුවන ලදී 'එය ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක සහ පළාත්වල සාමාජික ආයතන සමග වඩාත් පුළුල් ලෙස ව්‍යාප්ත වූ ව්‍යාපාරික සංවිධානය වන අතර රටපුරා වාණිජ මණ්ඩල සහ ව්‍යාපාරික සංගම් 63 කට අධික සාමාජිකත්වයකින් සමන්විතය'

කීර්ති ගුණවර්ධන ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා විශේෂ උපාධිදාරියෙකු වන අතර ව්‍යාපාර සහ මුල්‍ය පරිපාලනය සම්බන්ධව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ඇත. මෙයට අමතරව ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ හයිපර්මීඩියා ඉංජිනේරු සහ මල්ටිමීඩියා තාක්ෂණය පිළිබඳ සුදුසුකම් ලබා ඇත.

ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනයේ සභාපතිවරයා ලෙස ඔහුපත් කිරීම පිළිබඳව අදහස් දක්වමින් කීර්ති ගුණවර්ධන මහතා ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනයේ සභාපතිවරයා ලෙස තේරිපත්වීම මහත් ගෞරවයක් සහ වරප්‍රසාදයක් බව පැවසීය. ශ්‍රී ලංකා වාණිජ මණ්ඩල සඳහා මා විශාල දායකත්වයක් ලබාදී තිබෙනවා. අප සම්මේලනයේ පෙර සභාපතිවරුන් මෙම සම්මේලනය ඉතා ඉහළ තත්වයකට ගෙන ඒම සඳහා නන් අයුරින් දායක වී ඇත. ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය ලෙස අප හා අනුබද්ධිත සියලුම වාණිජ මණ්ඩල සහ විශේෂවූ කාර්මාන්ත සඳහා සේවා සපයන අනුබද්ධිත ආයතන ශක්තිමත් කිරීමටත් ඔවුන්ගේ සේවාවන්ගේ අගය ඉහළ දැමීමටත් අවශ්‍ය පියවර ගන්නෙමි.

කීර්ති ගුණවර්ධන ශ්‍රී ලංකා මුද්‍රණ කරුවන්ගේ සංගමයේ සාර්ථක පෙර සභාපතිවරයෙකි. තීරුබදු වලින් තොරව ශ්‍රී ලංකාවට කඩදාසි සහ බෝඩ්වර්ග ආනයනය කිරීම සඳහා රජයේ බලධාරීන් සමග සාකච්ඡා කිරීම සහ එකඟතාව ලබාගැනීම මඟින් ශ්‍රී ලංකා මුද්‍රණ කර්මාන්තය නව මානයකට යොමු කරන ලදි. මෙමඟින් බොහෝ මුද්‍රණ සමාගම්වලට ඔවුන්ගේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීමට සහ නිෂ්පාදන ගෝලීය වෙළඳපොලට අපනයනය කිරීමට අවස්ථාව උදා විය.

ඔහු වසර 6ක් ශ්‍රී ලංකා ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ (International Chamber of Commerce Sri Lanka, ICCSL) සභාපතිවරයා විය. ප්‍රථම වරට ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ ජාත්‍යන්තර රැස්වීම් කිහිපයක්ම ශ්‍රී ලංකාවේ පැවැත්වුවේ ඔහුගේ සභාපතිත්වය යටතේය. ඔහු ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ නිෂ්පාදන බෝහෝමයක් ශ්‍රී ලංකාව තුළ ප්‍රචලිත කිරීමට කටයුතු කරන ලදි.

ඔහු දැනට අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙළඳ තොරතුරු සහ ප්‍රවර්ධනය පිළිබඳ උපදේශක කමිටුවේ සහ ශ්‍රී ලංකා මුද්‍රිත මාධ්‍ය ඇකඩමියේ සභාපතිත්වය දරයි. ඔහු ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ (SLSI) සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ සමාජිකයෙකු ලෙස සේවය කරයි. ඔහු සාර්ක් (SAARC) තොරතුරු තාක්ෂණ කවුන්සලයේ සභාපති, ශ්‍රී ලංකා මුද්‍රණ කරුවන්ගේ සංගමයේ සභාපති ලෙසද කටයුතු කර ඇත. ඉන්ග්‍රීන් මුද්‍රණ සහ ග්‍රැෆික් ආයතනයේ සහ ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ සමාජිකයෙකු ලෙසද සේවය කර ඇත.